IHRA
UNIVERSITY OF COLOMBO

68

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2014

(දෙවන සෙමෙස්තර පරීක්ෂණය)

(පවත්වන ලද්දේ 2016 මාර්තු)

## BLE 207(b) – පිරිවැයකරණය හා විගණනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. (අ) පිරිවැයකරණය ආශ්‍රයෙන් සැපයෙන තොරතුරු කළමනාකරණයට සිය තීරණ ගැනීමේදී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) සුරතුර නිෂ්පාදකයෝ 2016 පළමු මස තුළදී සිය නිෂ්පාදන කටයුතු සඳහා දරා ඇති වියදම් හා වෙනත් කැපකිරීම් පහත පරිදි සාරාංශ කොට ඇත.

i. අමුද්‍රව්‍ය ගැනුම් රු. 120,000
වෙනත් උපාංග රු. 14,000
නිමි භාණ්ඩ ඇසුරුම් පොලිතින් රු. 2,000
අමුද්‍රව්‍යය ගැනුම් වලින් රු. 3,500/- තොගද පොලිතින් වලින් රු. 2,000/- ක්ද මාසය අවසාන වෙන විට ඉතිරිව තිබුණි.

ii. සේවක වැටුප් -

| | |
|---|---|
| නිෂ්පාදන කම්කරුවන්ට | රු. 80,000/- |
| සුපරීක්ෂක දීමනා | රු. 30,000/- |
| කම්හල් මුරකරුට ගෙවීම් | රු. 24,000/- |
| (මොහු දිවා කාලයේ කාර්යාලයේ සේවය කරන බැවින් වැටුපෙන් 2/3 කාර්යාලයට අදාල වේ. | |
| කම්හල් වාහනයේ රියදුරුට ගෙවීම් | රු. 20,000/- |
| විදුලි කාර්මිකයන්ට ගෙවීම් | රු. 12,000/- |
| කම්හල් කළමනාකරුට ගෙවීම් | රු. 32,000/- |
| සේවක ප්‍රසාද දීමනා (නිෂ්පාදනය මත) | රු. 7,000/- |

iii. වෙනත් වියදම්

| | |
|---|---|
| කම්හල් විදුලිය සහ ඉන්ධන | රු. 21,000/- |
| කම්හල් ජල බිල්පත් | රු. 3,200/- |
| කම්හල් ගොඩනැඟිලි කුලී | රු. 6,000/- |
| කම්හල් ගොඩනැඟිලි කුලී අළුත්වැඩියා | රු. 2,000 |
| ප්‍රධාන කළමනාකරුගේ වැටුප | රු. 50,000/- |
| කාර්යාල සේවක වැටුප් | රු. 14,000/- |
| කාර්යාල වෙනත් වියදම් | රු. 2,800/- |
| සේවක ආපනශාලා සැපයුම් | රු. 12,000/- |
| බෙදාහැරීමේ සේවක වැටුප් | රු. 6,000/- |
| බෙදාහැරීමේ වාහන වියදම් | රු. 8,000/- |
| බෙදාහැරීමේ වාහන අලුත්වැඩියා | රු. 2,000/- |
| ප්‍රචාරණය සහ දැන්වීම් ගාස්තු | රු 5,000/- |
| නිෂ්පාදන මෝස්තර නිර්මාන කුලී | රු. 7,500/- |

බෙදාහැරීමේ කටයුතු සඳහා යොදා ගන්නා වාහනයේ පිරිවැය රු. 600,000/- ක්වූ අතර එය 10% බැගින් වාර්ෂිකව සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ඇත.

නිෂ්පාදන අංශයේ යන්ත්‍ර රු. 280,000/- ට මිලදී ගෙන තිබූ අතර 20% බැගින් එකී යන්ත්‍ර සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ඇත.

ඉහත තොරතුරු ආශ්‍රයෙන්,

i. ඍජු ද්‍රව්‍ය පිරිවැය, ඍජු ශ්‍රම සහ වෙනත් ඍජු පිරිවැය දක්වමින් ප්‍රාථමික පිරිවැයද,

ii. නිෂ්පාදන, පරිපාලන සහ විකුණුම් හා බෙදාහැරීමේ පොදු කාර්ය වෙන වෙනම දක්වමින් මුළු පොදුකාර්යයද,

iii. මුළු පිරිවැයද,

iv. නිමි ඒකකයක පිරිවැයද ගණන් බලන්න.

(ලකුණු 12)
(මුළු ලකුණු 20)

2. (අ) නිෂ්පාදන ආයතනයකට අමුද්‍රව්‍ය තොග පාලනයේ ඇති වැදගත්කම පැහැදිලි කරමින්, අමු ද්‍රව්‍ය තොග පාලනය සඳහා යොදාගත හැකි ශිල්ප ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(ආ) පහත සඳහන් තොරතුරු ආශ්‍රයෙන් L X 102 නම් වූ අමුද්‍රව්‍යයෙහි ආර්ථික ඇනවුම් ප්‍රමාණය (EOQ) ගණන් බලන්න.

කාර්තුවක අමුද්‍රව්‍ය පාරිභෝජනය ඒකක 2000 එක් ඇනවුමක් පිලියල කිරීමේ පිරිවැය රු. 50/- අමුද්‍රව්‍ය ඒකකයක පිරිවැය රු. 40/- තොග පවත්වාගැනීමේ පිරිවැය 20% ය.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

3. (අ) "නිෂ්පාදන ආයතනයකට ප්‍රසාද දීමනා ක්‍රමයක් යෝජනා කිරීමේදී, එය සෑම සේවකයෙකුටම ගැලපෙන මෙන්ම යෝග්‍ය ක්‍රමයක් ද විය යුතුය".

එවැනි යහ දිරි දීමනා (ප්‍රසාද දීමනා) ක්‍රමයක දැකිය හැකි ලක්ෂණ කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) කර්මාන්ත ශාලාවක නිෂ්පාදන දෙපාර්තමේන්තු අංක 2 ට අදාලව 2016 ජනවාරි මාසය සඳහා දරා ඇති පොදුකාර්ය පිරිවැය දත්ත පහත පරිදි සාරාංශ කොට ඇත.

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | රු. 54,000/- |
| සෘජු ශ්‍රම පිරිවැය | රු. 45,000/- |
| වැඩකල ශ්‍රම පැය | 36,000 |
| වැඩකල යාන්ත්‍රික පැය | 30,000 |

මෙහි දෙපාර්තමේන්තුව අදාල පොදු කාර්ය පිරිවැය රු. 36,000/- කි. මෙම දෙපාර්තමේන්තුවෙන් නිමකල ඇනවුමකට අදාල තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය භාවිතය | රු. 6,000/- |
| සෘජු ශ්‍රම පිරිවැය | රු. 3,200/- |
| ගත කල යන්ත්‍ර පැය | 2,400 |
| ගත කල ශ්‍රම පැය | 3,200 |

භාවිතයේ පවතින විවිධ පදනම් ආශ්‍රයෙන් ඇනවුමකට ඇතුලත් කලයුතු පොදු කාර්ය පිරිවැය ගණන් බලන්න. අවම වශයෙන් විවිධ පදනම් හතරක්වත් උපයෝගී කර ගන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

4. (අ) "ක්‍රමානුකූලව ගිණුම් පොත් පවත්වා ඇති ආයතනයකට විගණනය අවශ්‍ය නොවන අතර එය මුදල් නාස්ති කිරීමක් පමණකි".

මෙම ප්‍රකාශනයට ඔබ එකඟවන්නේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) ඔබගේ කලත්‍රයා සභාපති ලෙස කටයුතු කරන ග්‍රාමීය සංවර්ධන සමිතියේ/ කාන්තා සංවිධානයේ වර්ෂ අවසාන ගිණුම් විගණනය කරදෙන ලෙස එම සමිතියේ ලේකම්වරයා ඔබගෙන් ඉල්ලීමක් කර ඇත.

මෙම විගණනය ඔබට භාරගත හැකිද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

5. (අ) "විගණන සාක්ෂි ලබාගැනීමේදී ගණුදෙනු නිවැරදිව සිදුවී ඇති බව තහවුරු කර ගැනීම පිණිස ගණුදෙනු සංනිරීක්ෂණය වැදගත් වේ".

විගණකයෙකු විසින් ණයට විකුණුම් ගණුදෙනුවක් සංනිරීක්ෂණය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) (i) අභ්‍යන්තර පාලනය

(ලකුණු 04)

(ii) අභ්‍යන්තර පරීක්ෂාව

(ලකුණු 03)

(iii) අභ්‍යන්තර විගණනය

(ලකුණු 03)

කෙටියෙන් පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 20)

6. (අ) ව්‍යාපාර කටයුතු පොදු වශයෙන් පරීක්ෂා කිරීම සඳහා යොදාගත හැකි අභ්‍යන්තර පාලන ප්‍රශ්නාවලියක් පියවර දහයකින් (10) යුක්තව පිළියෙල කරන්න.

(ලකුණු 10)

(ආ) (i) නියැදි සංනිරීක්ෂණය

(ලකුණු 04)

(ii) ගැඹුරින් සංනිරීක්ෂණය

(ලකුණු 03)

(iii) මාරුවෙන් මාරුව සංනිරීක්ෂණය

(ලකුණු 03)

කෙටියෙන් පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 20)

7. ශේෂ පත්‍රයේ මුහුණත දක්වා ඇති වත්කම් සහ වගකීම් අයිතමයන් සත්‍යාපණය කරන අයුරු පැහැදිලි කරන්න.

(i) මෝටර් රථ
(ii) බැංකු ශේෂය
(iii) දිගුකාලීන බැංකු ණය
(iv) උපචිත වියදම්

(කොටසකට ලකුණු 05 බැගින් මුළු ලකුණු 20)